කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
නීති පීඨය
නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර - 2019 (පුනරීක්ෂණ)

# ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: හතයි (07)
ප්‍රශ්න පත්‍රයේ ඇති පිටු සංඛ්‍යාව: හතරයි (04)

ඕනෑම ප්‍රශ්න <u>හතරකට</u> (04) <u>පමණක්</u> පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

01. සමන්, ඒබීසී සමාගමේ ප්‍රධාන ගණකාධිකාරිවරයා විය. වයස අවුරුදු 12 වන විටදී, ඔහුගේ පියා මියගොස් තිබුණ හෙයින්, ඔහු තම මව සමඟ ඉතා සමීප බැඳීමක් ඇතිකරගෙන තිබුණි. 2020 පෙබරවාරි 10 වන දින, රුවන්ගේ නොසැලකිලිමත් රිය ධාවනය හේතුකරගෙන සමන් රිය අනතුරකට භාජනය වී, මියගියේය. ඔහුගේ මරණය සිදුවන විටදී, සමන් විසි දෙවන වියේ පසුවූ අවිවාහකයකු වූයේය. ඇගේ එකම දරුවා මරණයට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇයට අත්විඳීමට සිදු වූ මූල්‍යමය ආධාර අහිමිවීම (Loss of Financial Support) සම්බන්ධව වන්දි යාචනය කරමින් රුවන් ට එරෙහිව සිවිල් නඩුවක් පැවරීමට සමන්ගේ මවට අවශ්‍යව ඇත. තම ආදරණීය පුත්‍රයාගෙන් ලැබුණු ආදරය, රැකවරණය සහ සමාගමය අහිමිවීම (Loss of love, care and companionship) සම්බන්ධයෙන් වන්දි යාචනය කිරීමට සමන්ගේ මව අදහස් කරයි.

ශ්‍රී ලංකාවේ රෝම-ලන්දේසි නීතිය ව්‍යවස්ථා මගින් වෙනස් කිරීමට භාජනය කිරීම සම්බන්ධව විශේෂ අවධානය යොමු කරමින්, රටෙහි දැනට පවතින නීතියට අනුව, සමන්ගේ මවට ඉහත දක්වා ඇති අලාභ යාචනය කිරීමට හිමිකම් ඇත්තේ ද යන්න සම්බන්ධව සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ ව්‍යවස්ථා සහ නඩු තීන්දු අධිකාරීන් මගින් තහවුරු කළ යුතුය.

( ලකුණු 25)

02. ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ, ඉංග්‍රීසි නීතියෙහි පිළිගැනීම (Reception of English law) සම්බන්ධව, අධිකරණයේ භූමිකාවේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. ඔබේ සාකච්ඡාව, අදාල නෛතික අධිකාරීන් මගින් තහවුරු කළ යුතුය.

(ලකුණු 25)

03. උඩරට පියෙකු වන හොඳහාමි, අප්පුහාමි, පොඩිහාමි සහ මැණිකේ යන දරුවන් තිදෙනා ජීවත්ව සිටියදී මිය ගියේය. පොඩිහාමි, කිරිහාමි සමග විවාහ වූ අතර මැණිකේ, හේතුහාමි සමඟ විවාහ වූවාය. එම ස්වාමිපුරුෂයන් දෙදෙනාම ගාල්ල ප්‍රදේශයේ පුද්ගලයන්ය. ඔවුන්ගේ පියාගේ මරණයෙන් කෙටි කාලයකට පසුව, පොඩිහාමි සහ මැණිකේ, මුල්ගෙදර (පාරම්පරික නිවස) අතහැර දමා පිටත් වූහ. දැන්, අප්පුහාමි විසින් ඔවුන්ව පාරම්පරික නිවසට ප්‍රවේශ වීමෙන් වලක්වනු ලබයි. තම සහෝදරියන්ගේ විවාහ 'දීග' විවාහ වන අතර එමනිසා, තම මියගිය පියාගේ දේපළ සම්බන්ධව, ඔවුන්ට අයිතිවාසිකම් හිමි නොවන බව ඔහු තර්ක කළේය.

උඩරට අන්තිම කැමතිපත්‍රරහිත අනුප්‍රාප්ති නීතිය යටතේ, හොඳහාමිගේ දියණියන් දෙදෙනා සතු අයිතිවාසිකම් විස්තර කරන්න.

(ලකුණු 25)

04. (අ) සහ (ආ) කොටස් <u>දෙකටම</u> පිළිතුරු ලියන්න.

(අ) "බොහෝමයක් ජනවර්ග සහ ආගම් මෙන්ම විවාහ ආඥාපනත් සහ පනත් ගණනාවක් පවතින ශ්‍රී ලංකා වැනි රටක, ස්ථිර වාසය දරන වාසිකයන්ට, ඔවුන්ගේ ආගම සහ පුද්ගල නීතිය වෙනස් කිරීමට නෛසර්ගික අයිතියක් පවතින අතර, ඒලෙස වලංගු බහුවිවාහයට එළඹීමට ද හැකියාව ඇත. එම නෛසර්ගික අයිතිය අවලංගු කිරීමට නම්, එය ව්‍යවස්ථාවක් මඟින් සිදුකළ යුතුය."

*Lord Upjohn in the Attorney General v. Reid, (1964) 67 NLR 25 at p.25*

(අ. පි. බ.)

මෙම අධිකරණ මතය මගින් මුස්ලිම් නීතියේ අදාළත්වය සම්බන්ධව, ශ්‍රී ලංකාවේ පවතින වර්තමාන නෛතික තත්ත්වය නිවැරදි ලෙස පිළිබිඹු වන්නේ ද යන්න සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ නෛතික අධිකාරීන් ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 15)

(ආ) අබ්දුල් යනු, රහීම් සහ සුහානා විසින් දරුකමට හදාගත් පුත්‍රයාය. ස්වකීය දේපල සම්පූර්ණයෙන්ම අබ්දුල් වෙත ලබාදීමට රහීම්ට අවශ්‍ය වේ. රාසික් යනු රහීම්ගේ වැඩිමහල් සහෝදරයාය. රාසික් රහීම්ට ප්‍රකාශ කරනුයේ, 1941 අංක 24 දරණ දරුවන් දරුකමට හදාගැනීමේ ආඥාපනත යටතේ, අබ්දුල්ව දරුකමට හදා ගෙන ඇති බැවින්, අන්තිම කැමතිපත්‍ර රහිත අනුප්‍රාප්ති නීතිය යටතේ වුවත්, ඔහුට දේපල සඳහා උරුමකම් කීමට හැකි බවයි.

ඔබ රාසික්ගේ අදහස සමඟ එකඟවන්නේහිද? ඔබගේ පිළිතුර අදාළ නෛතික අධිකාරීන් ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 10)

05. සූර්යා 1990 දී යාපනයේ උපත ලැබීය. පාරම්පරිකව එහි පදිංචි වී සිටි ඔහුගේ දෙමාපියන්ට එම ගමෙහි වටිනා නිවසක් සහ කෘෂිකාර්මික ඉඩම් හිමිව තිබුණි. සූර්යයා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබමින් සිටියදී, ඔහුට රාධිකා මුණගැසුණි. ඔවුහු ආදරයෙන් බැඳුණු අතර විවාහ වීම සඳහා තීරණය කළෝය. රාධිකා කොළඹ ධනවත් ව්‍යාපාරික පවුලක එකම දියණිය වේ. විවාහයෙන් අනතුරුව, කොළඹ පදිංචි වීමට හා වැල්ලවත්තේ පිහිටි, රාධිකාගේ පියාට අයත් ව්‍යාපාරික ස්ථානයේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් සේවය කිරීමට ඔහු අදහස් කරයි.

විවාහයෙන් අනතුරුව, කොළඹ පදිංචි වුවහොත් තමන්ට අදාල වන පුද්ගල නීතිය වෙනස් වන්නේ ද යන්න පිළිබඳව දැනගැනීමට සූර්යා අපේක්ෂා කරයි. සූර්යා සමඟ

(අ. පි. බ.)

සිදුකරනු ලබන විවාහය, ඇය කෙරෙහි නීතිමය බලපෑමක් ඇති කරන්නේ ද යන්න පිළිබඳව දැනගැනීමට රාධිකාට අවශ්‍ය වේ.

සූර්යාට සහ රාධිකාට අදාල වන නීතිය පිළිබඳව විස්තර කරන්න. ඔබගේ පිළිතුර, අදාළ නෛතික අධිකාරීන් මගින් තහවුරු කළ යුතුය.

(ලකුණු 25)

06. අධිකරණයේ කාර්යක්ෂමතාවය; එහි ආකෘතිය, ප්‍රවේශයට ඇති පහසුව, නඩුතීන්දුවල ගුණාත්මකභාවය සහ නඩුකියන්නන්හට සමානාත්මතාවය ඉටුවීම ඇතුළුව අධිකරණයේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ බොහෝ පැතිකඩයන් වෙත අවධානය යොමු කළ හැකිය.

ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය ඇසුරින්, ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

07. "සුළුතර ජන කණ්ඩායම් සහ බහුතර ප්‍රජාව අතර ඇතිවන අන්තර්-වාර්ගික සම්බන්ධතාවයන්හි එක් ප්‍රතිඵලයක් නම් බහුවිධතාවයයි. එනම්, වෙනස් වූ ජන කණ්ඩායම් ඔවුන්ගේ අසමසම සංස්කෘතිය සහ චර්යාවන් ආරක්ෂා කරගන්නා අතරතුර, පොදු දේශීය වටිනාකම් සහ අරමුණු තවදුරටත් හුවමාරු කරගැනීම වේ."

Gordon, Milton, *Assimilation in American Life* (Oxford University Press, 1964, pp. 71-73)

ඉහත ප්‍රකාශය, ශ්‍රී ලංකාවේ බහුවිධ නීති පද්ධතියේ පවතින යෝග්‍ය සහ යෝග්‍ය නොවන ලක්ෂණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

*******